# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2164/53 - 2020 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, (2020 ජනවාරි මස 30 වන දින අංක 2160/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2009 මැයි මස 28 වන දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ, I වන තීරයේ දැක්වෙන ''මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය'' යන අයිතමයට අනුරූපීව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන සියලු සටහන් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *පීඨය* | *අධ්‍යයන අංශය* |
| ''මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය |
| | 3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. සිංහල සහ ජන සන්නිවේදන අධ්‍යයන අංශය |
| | 5. ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයන අංශය |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *පීඨය* | *අධ්‍යයන අංශය* |
| | 6. පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය |
| | 7. ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයන අංශය |
| | 8. දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය |
| | 9. අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයන අංශය |
| | 10. සමාජ විද්‍යා අධ්‍යයන අංශය |
| | 11. මානව විද්‍යා අධ්‍යයන අංශය |
| | 12. දර්ශනය සහ මනෝ විද්‍යා අධ්‍යයන අංශය |
| | 13. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය |
| | 14. භාෂා, සංස්කෘතික අධ්‍යයන සහ ප්‍රාසාංගික කලා අධ්‍යයන අංශය |
| | 15. සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයන අංශය''. |

03 - 508

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.